# පරිවර්තනීය අධ්‍යාපනයකින් පරිවර්තනීය ශ්‍රී ලංකාවක්

අන්තර්ගත පාදක අධ්‍යාපනයෙන් (CBE)
ඉගෙනුම් පල පාදක අධ්‍යාපනයකට (OBE)

මොඩියුල(ර්) ඉගෙනීමේ භූමිකාව සහ ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ප්‍රවේශය

## පුහුණුකරුවන් පුහුණු කිරීම 2026

විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව



teachmore.lk

# පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනෙන් අපේක්ෂිත ඵල

## මෙම සැසිය අවසානයේ ඔබට,

- සංශෝධිත විෂයමාලාවේ දර්ශනය හා දිශානතිය විස්තර කිරීමට
- අන්තර්ගතය ආවරණයේ සිට ඉගෙනුම් පල සාධනය දක්වා සිදු වන වෙනස පැහැදිලි කිරීමට
- ඉගෙනුම් පල, ක්‍රියාකාරකම්, ඇගයීම සහ සාක්ෂි එකිනෙකට පෙළ ගැස්වීමට
- ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් හා පාසල්වලට සහය වීමට
- ක්‍රියාත්මක කිරීම, වැඩිදියුණු කිරීම, (සාධන සාක්ෂි භාවිත කර) අධීක්ෂණය කිරීමට

හැකියාව ලැබේ.

පැය දෙකක ඉගෙනුම් ගමන් මඟ ඔස්සේ

- ප්‍රතිසංස්කරණයක් අවශ්‍ය වන්නේ ඇයි?
- ඉගෙනුම් පල පදනම් අධ්‍යාපනය වෙත මාරුව
- මොඩියුල(ර්) පදනම් ඉගෙනීම
- ක්‍රියාත්මක කිරීම
- ප්‍රායෝගික ක්‍රියාකාරකම් හා ක්‍රියාමාර්ග

teachmore.lk

# අධ්‍යාපනයේ පරිවර්තනයක් අවශ්‍ය වන්නේ ඇයි ?

## වර්තමාන අභියෝග

- විෂය අන්තර්ගතය ප්‍රමාණයෙන් වැඩි වීම
- විභාග කේන්ද්‍රීය ඉගෙනීම
- නිපුණතා සංවර්ධනය සීමිත වීම
- දුර්වල සමෝධානය (Poor integration)
- ගුරු කේන්ද්‍රීය පන්තිකාමර
- ප්‍රායෝගික ඉගෙනීම අවම වීම
- අනාගත රැකියා අවශ්‍යතා සමග නොගැළපීම

## ප්‍රතිසංස්කරණ දිශානතිය

- ඉගෙනුම් පල-පාදක ඉගෙනීමක්
- ඉගෙනුම්-කේන්ද්‍රීය අධ්‍යාපනයක්
- නිපුණතා, කුසලතා හා වටිනාකම් සඳහා ඉඩක්
- සමෝධානිත ඉගෙනීමක් **(Integrated learning)**
- නම්‍යශීලී මාර්ගයන් **(Flexible pathways)**
- අර්ථවත් ඇගයීමක්

## ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය

- ඉගැන්වීම් කාලය (Instructional time)
- ගුරුවරු සංඛ්‍යාව
- යටිතල පහසුකම්
- කාලසටහන් සකස් කිරීම
- මූල්‍ය තිරසරභාවය
- ශිෂ්‍යන්ගේ යහපැවැත්ම **(Student well-being)**

**ප්‍රතිසංස්කරණය පද්ධති ක්‍රියාත්මක කිරීමේ හැකියාව: ඉගැන්වීම් කාලය, වැඩබර, ගුරුවරු සංඛ්‍යාව, යටිතල පහසුකම්, කාලසටහන් කළමනාකරණය, තක්සේරුකරණ හා ඇගයීම් සහ මූල්‍ය තිරසරභාවය යන කරුණු අධ්‍යාපනික අභිලාෂ සමග සමතුලිත කළ යුතු ය.**

# අධ්‍යාපනය පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්ති

| | |
|---|---|
| **නිදහස් අධ්‍යාපනය හා සම ප්‍රවේශය** | පොදු ජාතික රාමුවක්, සියලු දෙනාට ළඟා විය හැකි පරිදි සමාන ප්‍රවේශ සහ සමාන ඉගෙනුම් අවස්ථා කෙරෙහි අවධානය |
| **මානව සංවර්ධනයට සහ සේවා නියුක්තියට අදාළතාව** | නිපුණතා, ප්‍රායෝගික ඉගෙනීම, වෘත්තීය මාර්ගෝපදේශය, සාමාන්‍ය, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනය සම්බන්ධ කරන මාර්ග |
| **සියල්ලන්ට ම පිළිගත හැකි බව** | ඉගෙනුම කේන්ද්‍ර කරගත් ප්‍රවේශ, සියලු දෙනා ඇතුළත් කිරීම, විවිධ ඉගෙනුම් අවශ්‍යතා සහ නම්‍යශීලී මාර්ග |
| **සමාජයට වග වන පුරවැසියන්** | වටිනාකම්, ආචාරධර්ම, සමාජ සමගිය, පුරවැසිභාවය, පරිසර වගකීම සහ ප්‍රජා සහභාගීත්වය |
| **තිරසර බව හා නවෝත්පාදනය** | විචාරාත්මක හා නවෝත්පාදන චින්තනය, තාක්ෂණය, ව්‍යවසායකත්වය, විමර්ශනය සහ තිරසාර සංවර්ධනය |
| **යාවජීව අධ්‍යාපනය** | ස්වයං ඉගෙනීමකට මග පෙන්වීම, ඉගෙනීමට ඉගෙනීම, සන්නිවේදනය, ඩිජිටල් හා මාධ්‍ය සාක්ෂරතාව සහ අඛණ්ඩ සංවර්ධනය කිරීම |

- ❖ 2020/2023 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ - ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF)
- ❖ 2026 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ - සාමාන්‍ය අධ්‍යාපන සංකල්ප පත්‍රය (NEC)

# විෂයමාලාවේ අරමුණ සහ එය අවබෝධ කර ගත යුතු ආකාරය

teachmore.lk

| ප්‍රතිපත්තිය / ක්‍රියාත්මක කිරීමේ මට්ටම | පිළිතුරු සපයන්නේ කුමන ප්‍රශ්නවලට ද? | ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇසිය යුතු ප්‍රශ්න |
|---|---|---|
| NEC සංකල්ප පත්‍රය/ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව (NEPF), ජාතික විෂයමාලා රාමුව (NCF) | අපේක්ෂිත ශිෂ්‍යයා කෙබඳු අයෙක් ද? Why and what kind of learner? | සෑම සිසුවෙක් ම දැන ගැනීමට, සිදු කිරීමට හා අගය කිරීමට හැකි විය යුත්තේ කුමක් ද? What should every learner become able to know, do and value? |
| විෂයමාලාව | සමස්ත ඉගෙනුම් ව්‍යුහය කෙසේ ද? What is the overall learning architecture? | අධ්‍යාපන අවධි, ඉගෙනුම් ක්ෂේත්‍ර, විෂයයන් සහ මොඩියුල සංවිධානය කරන්නේ කෙසේ ද? |
| විෂය අන්තර්ගත ව්‍යාප්තිය/ විෂය නිර්දේශ | ඉගෙන ගන්නේ කුමක් ද සහ එය ඉදිරියට සංවර්ධනය වන්නේ කෙසේ ද? | 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා ඉගෙනුම් පල හා අන්තර්ගතය ගොඩනැගෙන්නේ කෙසේ ද? |

# විෂයමාලාවේ අරමුණ සහ එය අවබෝධ කර ගත යුතු ආකාරය

teachmore.lk

| ප්‍රතිපත්තිය / ක්‍රියාත්මක කිරීමේ මට්ටම | පිළිතුරු සපයන්නේ කුමන ප්‍රශ්නවලට ද? | ක්‍රියාත්මක කිරීම පිළිබඳ ඇසිය යුතු ප්‍රශ්න |
|---|---|---|
| ගුරු මාර්ගෝපදේශය | සිසුන්ගේ ඉගෙනුමට පහසුකම් සලසන්නේ කෙසේ ද? | ඉගෙනුම් පල සඳහා සහාය වන ඉගෙනුම් අද්දැකීම්, සම්පත් සහ ඇගයීම් ප්‍රවේශ මොනවා ද? |
| මොඩියුලය / ක්‍රියාකාරකම් පොත Module/ Activity Book | සිසුන් කරන්නේ කුමක් ද? What does the learner do? | සිසුන්ට ඉගෙනීම පුහුණු වීමට හා ආදර්ශනය කිරීමට උපකාර වන ව්‍යුහගත ක්‍රියාකාරකම් මොනවා ද? |
| තක්සේරුකරණය | ඉගෙනීම පෙන්වන ඉගෙනුම් සාක්ෂි (evidence) මොනවා ද? | ප්‍රගතිය, සාධනය, සහය සහ සිසු අවශ්‍යතා හඳුනාගන්නේ කෙසේ ද? |
| පාසල වැඩිදියුණු කිරීම | වැඩිදියුණු කළ යුත්තේ කුමක් ද? What must improve? | මෙහෙයවන්නන් හා පරිපාලකයන් සැලකිල්ලට ගත -යුතු ඉගෙනුම් සාධක මොනවා ද? |

teachmore.lk

# ශිෂ්‍ය ඉගෙනුම් අද්දැකීම්වල සිදු වන වෙනස්කම්

| පෙර: සාම්ප්‍රදායික රටාව | නව දිශානතිය: පරිවර්තනය |
|---|---|
| • ආවරණය කළ යුතු විෂය අන්තර්ගතය කුමක් ද? | • ශිෂ්‍යයන් ළඟා කර ගත යුතු ඉගෙනුම් පල මොනවා ද? |
| • පෙළපොත/පරිච්ඡේදය අනුක්‍රමික / අනුපිළිවෙළ දක්වන පාඩම් උපාංග | • ඉගෙනුම් පල සඳහා සහය වන මොඩියුල හා ක්‍රියාකාරකම් පොත් , සම්පත් හා ඉගෙනුම් අද්දැකීම් |
| • ගුරුවරයා ප්‍රමුඛ වීම හා ඉගෙනුම් වේගය තීරණය කරන්නා වීම | • ගුරුවරයා සුසාධ්‍යකරුවෙකු (පහසුකම් සපයන්නෙකු), මාර්ගෝපදේශකයකු හා සම්පත් පුද්ගලකු වීම |
| • ශිෂ්‍යයන් ප්‍රධාන වශයෙන් සවන් දීම, පිටපත් කිරීම ස්මරණය හා ආවර්ජණයට කොටු වීම | • ශිෂ්‍යයන් විමර්ශනය කිරීම, සාකච්ඡා කිරීම, නිර්මාණය කිරීම, පුහුණුව හා භාවිතයට ගැනීම සිදු කිරීම |

# ශිෂ්‍ය ඉගෙනුම් අද්දැකීම්වල සිදු වන වෙනස්කම්

teachmore.lk

| පෙර: සාම්ප්‍රදායික රටාව | නව දිශානතිය: පරිවර්තනය |
|---|---|
| • ඇගයීම බොහෝ විට ඉගැන්වීමෙන් පසුව සිදු වීම | • ඇගයීම තක්සේරුකරණය ඉගෙනුම තුළට අන්තර්ගත කර ඇති අතර සාක්ෂි/ දත්ත මත ප්‍රතිපෝෂණය |
| • විභාග පදනම් කර ගත් පරීක්ෂණ ප්‍රමුඛ වීම | • ඉගෙනුම් සාධක (සාක්ෂි) ලෙස කාර්යසාධනය, ව්‍යාපෘති, කාර්ය සංග්‍රහ (Portfolio), ඉදිරිපත් කිරීම්, ප්‍රායෝගික වැඩ හා වෙනත් සුදුසු ක්‍රම ඇතුළත් වීම |
| • සාර්ථකත්වය = අන්තර්ගතය සම්පූර්ණ කිරීම | • සාර්ථකත්වය = අපේක්ෂිත ඉගෙනීම පල හා නිපුණතා ප්‍රදර්ශනය කිරීම |
| • පාසලේ උගත් බොහෝ දෑ සැබෑ ජීවිතයට හෝ රැකියාවට අදාළ නොවීම | • සුථත්‍ය සහ ප්‍රජාව සමඟ සම්බන්ධිත සන්දර්භ මඟින් ඉගෙනීම, ඉගෙනුම ජීවිතය හා රැකියාව සමග සම්බන්ධ කිරීම |

teachmore.lk

# සාමාන්‍ය අධ්‍යාපනයේ විවිධ ඉගෙනුම් අවධි /මට්ටම්

සාමාන්‍ය අධ්‍යාපනයේ සෑම අවධියකට ම/මට්ටමකට ම පැහැදිලි වෙනස් අරමුණක් ඇත.

| ප්‍රාථමික අධ්‍යාපන අවධිය | කනිෂ්ඨ ද්විතීයික අවධිය | ජ්‍යෙෂ්ඨ ද්විතීයික පළමු අවධිය | ජ්‍යෙෂ්ඨ ද්විතීයික දෙවන අවධිය |
|---|---|---|---|
| 1-5 ශ්‍රේණි | 6-9 ශ්‍රේණි | 10-11 ශ්‍රේණි | 12-13 ශ්‍රේණි |
| මූලික ජීවන කුසලතා සඳහා පදනම | ජීවිතය සඳහා පදනම | වෘත්තීය සූදානම සඳහා පදනම | ශාස්ත්‍රීය සහ වෘත්තීය ජීවිතය සඳහා පදනම |

ඉගෙනුම් පල එක් එක් අවධි/ මට්ටම් හතර පුරා පියවරෙන් පියවර අඛණ්ඩ ව වර්ධනය විය යුතු ය.

teachmore.lk

## පොදු ගුණාංග (General Attributes) :

**වසර 13ක අධ්‍යාපනය සම්පූර්ණ කළ පසු සමාජයට නික්මෙන ශිෂ්‍යයන් කෙබඳු අය විය යුතු ද?**

- දැනුම
- කුසලතා
- වටිනාකම්
- ආකල්ප
- නිපුණතා

අනාගතයට සූදානම්, ආචාරධර්මවලින් හෙබි, නවෝත්පාදනශීලි හා වගකිව යුතු පුරවැසියකු

වසර 13ක අධ්‍යාපනය සම්පූර්ණ කිරීමෙන් පසු, සමතුලිත ආකාරයකින් සංජානන, චිත්තවේගීය, සමාජීය, ශාරීරික සහ ආචාරධාර්මික මානයන් ඔස්සේ පෝෂණය වූ සමස්ත පරිපූර්ණ (Holistic) පුද්ගලයෙකු බිහි විය යුතු ය. ඔහු හෝ ඇය දැනුමෙන්, කුසලතාවලින්, වටිනාකම්වලින්, ආචාරධර්මවලින් සහ නිපුණතාවලින් සපිරි පුරවැසියෙකු විය යුතු ය.

# පන්ති කාමරයේ සෘජු ව දක්නට ලැබෙන පරිවර්තනීය වෙනස්කම්

teachmore.lk

| නිර්ණායක | පැරණි පන්ති කාමරය | නව පන්ති කාමරය |
|---|---|---|
| 1. අරමුණ | අන්තර්ගතය ආවරණය | අපේක්ෂිත ඉගෙනුම් පල සාධනය |
| 2. ඉගෙනුම් යෙදවුම් (සම්පත්) | පෙළපොත් මූලික අනුක්‍රමය | මොඩියුල, ක්‍රියාකාරකම් පොත්, ඉගෙනුම් යෙදවුම් (සම්පත්), මාර්ගෝපදේශ හා විවිධ සම්පත් |
| 3. පන්ති කාමරය | ගුරු කේන්ද්‍රීය | ඉගෙනුම් (ශිෂ්‍ය) කේන්ද්‍රීය |
| 4. ඉගෙනුම් අද්දැකීම් | සවන් දීම හා සිහිපත් කිරීම | ක්‍රියාකාරකම්, අනාවරණ, ගැටලු විසඳීම, සහයෝගීතාව හා සුථත්‍ය (Authentic) ඉගෙනුම් අද්දැකීම් ලබා දීම |

# පන්ති කාමරයේ සෘජුව දක්නට ලැබෙන පරිවර්තනීය වෙනස්කම්



| නිර්ණායක | පැරණි පන්ති කාමරය | නව පන්ති කාමරය |
|---|---|---|
| 5. තක්සේරුකරණය හා ඇගයීම | ඉගැන්වීමෙන් පසු ප්‍රධාන වශයෙන් ලිඛිත පරීක්ෂණ | ඉගෙනුම සඳහා/ලෙස /පිළිබඳ (for/as/of ) ඇගයීම හා තක්සේරුකරණය, ප්‍රතිපෝෂණය හා සාක්ෂි මගින් ඉගෙනීම |
| 6. ගුරුවරයා | දේශකයා/ මෙහෙයවන්නා | සුසාධ්‍යකරු (පහසුකම් සපයන්නා), මාර්ගෝපදේශකයා හා සම්පත් පුද්ගලයා |
| 7. ඉගැන්වීම් ක්‍රමවේදය | ප්‍රධාන වශයෙන් සෘජු උපදෙස් | නිර්මාපී (Constructive) , සහයෝගී, අනාවරණ පාදක, ව්‍යාපෘති පාදක, ගැටලු පාදක හා මිශ්‍ර ප්‍රවේශ (Blended) සුදුසු ලෙස යොදා ගත හැකි ය |
| 8. ශිෂ්‍යයා | දැනුම ලබා ගන්නා / කටපාඩම් (වණපොත්) කරන්නා | නිපුණ, ආචාරධර්මවලින් හෙබි, නිර්මාණශීලි, ස්වයං මගපෙන්වා ගනිමින් අනාගතයට සූදානම් පුරවැසියකු |

# අන්තර්ගත පාදක අධ්‍යාපනය හා ඉගෙනුම් පල පාදක අධ්‍යාපනය: සුසමාදර්ශී පරිවර්තනය

teachmore.lk

| මානය | අන්තර්ගත පාදක (Content-Based-CBE) | ඉගෙනුම් පල පාදක (Outcome-Based-OBE) |
|---|---|---|
| ප්‍රධාන ඉලක්කය | අන්තර්ගතය ආවරණය | ඉගෙනුම් පල |
| ආරම්භක ලක්ෂ්‍යය | පෙළපොත / විෂය අන්තර්ගතය | අපේක්ෂිත ඉගෙනුම් පල |
| ගුරුවරයා | දැනුම සපයන්නා | සුසාධ්‍යකරුවා / මාර්ගෝපදේශකයා |
| ශිෂ්‍යයා | දැනුම ලබා ගෙන එය නැවත ඉදිරිපත් කරයි | ඉගෙන ගත් දැනුම භාවිත කර ආදර්ශනය (Demonstrate) කරයි |
| ඉගැන්වීම | • දේශන • සටහන් •ස්මරණය<br>• ආවර්ජණය | • අනාවරණය • ක්‍රියාකාරකම්<br>• පුහුණුව • භාවිතය |
| ඇගයීම | ප්‍රධාන වශයෙන් විභාග සහ ප්‍රශ්නාවලි | • කාර්යසාධනය • කාර්ය (Tasks)<br>• ව්‍යාපෘති • කාර්ය සංග්‍රහ (Portfolios)<br>• රුබ්‍රික්ස් |
| සාර්ථකත්වය | විෂය නිර්දේශය ආවරණය/සම්පූර්ණ කිරීම | ඉගෙනුම් පල සාධනය පිළිබඳ සාක්ෂි |

CBE → OBE යනු දැනුම සහ විෂය අන්තර්ගතය නොසලකා හැරීමක් නොවේ. එය ඉගෙනුම් පල අත්පත් කර ගැනීම සඳහා මාධ්‍යයක් ලෙස අන්තර්ගතය වඩාත් උචිත ලෙස භාවිත කිරීම වෙත සිදුවන සුසමාදර්ශී පරිවර්තනයකි.

# මූලික වෙනස: විෂය නිර්දේශ ආවරණයෙන් ඉගෙනුම් පල සාධනය වෙත

**අන්තර්ගත පාදක අධ්‍යාපනය**

- කුමක් ඉගැන්විය යුතු ද?

අන්තර්ගතය →
ඉගැන්වීම →
අන්තර්ගත ආවරණය →
විභාගය

**ඉගෙනුම් පල පාදක අධ්‍යාපනය**

- සිසුන් දැනගත යුත්තේ, කළ යුත්තේ, ආදර්ශනය කළ යුත්තේ කුමක් ද?

ඉගෙනුම් පල →
ඉගෙනීම →
සාක්ෂි/තොරතුරු →
සාධනය

**සාක්ෂි/ තොරතුරු**

- සිසුන්ට ආදර්ශනය (Demonstrate) කිරීමට පුලුවන් දේ කුමක් ද?


- කාර්යන්/පැවරුම්
- කාර්යසාධනය
- නිර්මාණ
- පැහැදිලි කිරීම්

අන්තර්ගතයේ වැදගත්කම තවදුරටත් පවතී — එහි අරමුණ හා භාවිතය වෙනස් වේ.

**Content remains important — its purpose changes.**

# ඉගෙනුම් පල පාදක අධ්‍යාපනයේ (OBE) චක්‍රීය රාමුව

teachmore.lk




**Level Learning Outcome (LLO)**
එක් එක් අවධි/ මට්ටම්වලට අදාළ ඉගෙනුම් පල

**Intended Learning Outcomes (ILO)**
විෂයට අදාළ අපේක්ෂිත ඉගෙනුම් පල

**Activity Learning Outcomes (ALO)**
ක්‍රියාකාරකම්වලට අදාළ ඉගෙනුම් පල

teachmore.lk

# ඉගෙනුම් පල: ජාතික දිශානතියෙන් පන්ති කාමර භාවිතයට

ඉගෙනුම් පල ක්‍රමානුකූල ව සංවර්ධනය කර අධ්‍යාපන මට්ටම් පුරා ගළපා සකස් කළ යුතු ය.

ජාතික/පොදු ඉගෙනුම් පල (13 වසරක අධ්‍යාපනය නිම කළ පසු)

එක් එක් අවධි/මට්ටම්වලට අදාළ ඉගෙනුම් පල ( 5, 9, 11, හා 13 ශ්‍රේණි)

විෂය/මොඩියුලය අපේක්ෂිත ඉගෙනුම් පල

පාඩම / ක්‍රියාකාරකම අපේක්ෂිත ඉගෙනුම් පල

ඉගෙනුම් පල සාධනය පිළිබඳ සාක්ෂි
(තක්සේරුකරණය හා ඇගයීම)

**ප්‍රගමණය + පෙළගැස්ම = සංගතභාවය**

**Progression + alignment = coherence**

teachmore.lk

# ගුරුවරයාගේ නව භූමිකාව

සාම්ප්‍රදායික දේශන ක්‍රමයේ සිට සුසාධ්‍යකරණය දක්වා (Lecturing to Facilitator)

### අන්තර්ගත පාදක අධ්‍යාපනය

- පැහැදිලි කිරීම
- දේශනය
- සටහන් ලබා දීම
- ඉගැන්වීමේ වේගය පාලනය කිරීම
- මතකය/ ස්මෘතිය පරීක්ෂා කිරීම

→

### ඉගෙනුම් පල පාදක අධ්‍යාපනය

- පහසුකම් සැපයීම
- ප්‍රශ්න කිරීම
- මාර්ගෝපදේශය
- නිරීක්ෂණය කිරීම
- ප්‍රතිපෝෂණය ලබා දීම

මූලික ප්‍රශ්නය: "අද ශිෂ්‍යයන් සාධනය කළ යුත්තේ කුමක් ද?"

teachmore.lk

# සිසුන්ගේ නව භූමිකාව

ශිෂ්‍යයා සාම්ප්‍රදායික අක්‍රීය ග්‍රාහකයකු (receiver) නොව සක්‍රීය ව සවන්දෙන සහභාගිවන්නෙකු බවට පත්වේ.

### සක්‍රීය ශිෂ්‍යයා

දැනුම භාවිත කරයි, ප්‍රශ්න කරයි. නිර්මාණය කරයි. ප්‍රත්‍යවේක්ෂණය කරයි.

### ගැටලු විසඳන්නා

දැනුම භාවිත කරයි, ප්‍රශ්න කරමින්, නිර්මාණය කරමින් සහ ආවර්ජණය කරමින් ඉගෙන ගනියි.

### විචාරාත්මක චින්තකයා

දැනුම භාවිත කරයි, ප්‍රශ්න කරයි, ආවර්ජනය කරයි සහ නිර්මාණය කරයි.

### සහයෝගී ව කටයුතු කරන්නා

දැනුම භාවිත කරයි, ප්‍රශ්න කරයි, ආවර්ජනය කරයි නිර්මාණය කරයි සහ සහයෝගයෙන් කටයුතු කරයි.

### නවෝත්පාදකයා

දැනුම භාවිත කරයි, ප්‍රශ්න කරයි, නිර්මාණය කරයි සහ ප්‍රත්‍යවේක්ෂණය කරයි.

### වගකිවයුතු පුරවැසියා

දැනුම භාවිත කරයි, ප්‍රශ්න කරයි, නිර්මාණය කරයි, සමාජයට වග කිවයුතු පුරවැසියෙක් වෙයි.

# ඉගෙනුම් පල දෘශ්‍යමාන කරන ඉගැන්වීම් ක්‍රමවේද

| ඉගෙනුම් ප්‍රවේශය/ක්‍රමය | එය කුමන ආකාරයෙන් දිස් වන්නේද? |
|---|---|
| අනාවරණ පාදක ඉගෙනුම Inquiry-based learning | ශිෂ්‍යයන් ප්‍රශ්න අසමින්, සාක්ෂි රැස් කරමින්, විමර්ශනය කරමින්, පැහැදිලි කරමින් අනාවරණය කරයි. |
| ගැටලු-පාදක ඉගෙනුම Problem-based learning | ශිෂ්‍යයන් අර්ථවත් ගැටලුවක් සොයා ගනිමින්, දැනුම භාවිත කර ගැටලුවට විසඳුමක් සොයා ගනියි. |
| ව්‍යාපෘති-පාදක ඉගෙනුම Project-based learning | සලකනු ලබන කාලයක දී ශිෂ්‍යයන් විසින් සහයෝගිතාවෙන් යුතු ව ඵලදායි නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් (Process/Product) සම්පූර්ණ කරයි. |

ගුරුවරයාගේ නව ප්‍රශ්නය: “ඉගෙනුම් පල සාධනය සඳහා **ශිෂ්‍යයන්** සිදු කරන්නේ කුමක්ද?”

# ඉගෙනුම් පල දෘශ්‍යමාන කරන ඉගැන්වීම් ක්‍රමවේද

teachmore.lk

| ඉගෙනුම් ප්‍රවේශය/ක්‍රමය | එය කුමන ආකාරයෙන් දිස් වන්නේද? |
|---|---|
| **ක්‍රියාකාරකම / අද්දැකීම් පාදක ඉගෙනුම Activity / experiential learning** | ශිෂ්‍යයන් සැබෑ තත්ත්වයන්හීදි භාවිතයෙන්, නිරීක්ෂණයෙන්, පරීක්ෂණයෙහි යෙදෙමින්, පුහුණු වෙමින් ප්‍රත්‍යවේක්ෂණය කරමින් උගනියි. |
| **සහභාගීත්ව ඉගෙනුම Collaborative learning** | ශිෂ්‍යයන් මනා සන්නිවේදනයෙන්, භූමිකා බෙදා ගනිමින් එකිනෙකාට උදවු කර ගනිමින් සහයෝගයෙන් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් උගනියි. |
| **මිශ්‍ර / ඩිජිටල් ඉගෙනුම Blended / digital learning** | සාම්ප්‍රදායික පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම සඳහා තාක්ෂණය ( මාර්ගගත ඩිජිටල් මෙවලම් සහ වෙබ් පාදක ක්‍රියාකාරකම් වැනි..) සමග මිශ්‍ර කිරීම |
| **සුථත්‍ය ඉගෙනුම/ ප්‍රජාව සමග-සම්බන්ධිත ඉගෙනුම Authentic / community-linked learning** | ඉගෙනීම, සැබෑ ජීවිත සන්දර්භයන්, ප්‍රාදේශීය සම්පත්, ප්‍රජා අවශ්‍යතා, රැකියාව සහ ජීවිතය සමග සම්බන්ධ වේ. |

# විෂය උදාහරණ: විද්‍යාව/ගණිතය/ඉංග්‍රීසි

දැනුම → භාවිතය → ආදර්ශනය

## අන්තර්ගත පාදක අධ්‍යාපනය

### විද්‍යාව

- ප්‍රභාසංස්ලේෂණය නිර්වචනය කිරීම
- ගුරුවරයා ක්‍රියාවලිය පැහැදිලි කිරීම
- ඇගයීම්වලින් දැනුම සිහිපත් කිරීම

### ගණිතය

- රු. 800 න් 15% ප්‍රතිශතය ගණනය කිරීම

### ඉංග්‍රීසි

- ව්‍යාකරණ භාවිතයෙන් දෙන ලද අභ්‍යාසයක් සම්පූර්ණ කිරීම

## ඉගෙනුම් පල පාදක අධ්‍යාපනය

### විද්‍යාව

- පරීක්ෂණයක් පැවැත්වීම
- ප්‍රභාසංස්ලේෂණය ශාක වර්ධනයට සහාය වන ආකාරය පැහැදිලි කිරීම
- අණාවරණයෙන් සාක්ෂි ඉදිරිපත් කිරීම

### ගණිතය

- ප්‍රතිශත ඉගෙන ගැනීම හා එය සැබෑ ජීවිතයට භාවිත කර ගන්නා ආකාරය නිදසුන් සහිත ව ඉදිරිපත් කිරීම

### ඉංග්‍රීසි

- ඵලදායී ලෙස සැබෑ-ජීවිතයේ දී සංවාද පවත්වමින් සන්නිවේදනය කිරීම

ගුරුවරයාගේ ප්‍රශ්නය: **ශිෂ්‍යයන්ට පිළිතුරු දිය හැකි ද?** නැතහොත් අන්තර්ගතය අර්ථවත් ලෙස භාවිත කළ හැකි ද?

# තක්සේරුකරණය: ස්මරණයෙන් ඉගෙනුම් සාධනය වෙත

teachmore.lk

තක්සේරු කිරීම මගින් ශිෂ්‍යයින්ට ආදර්ශනය කළ හැකි දේ පෙන්විය යුතු ය.
Assessment should show what learners can demonstrate

### අන්තර්ගතය පදනම් කරගත් ඇගයීම

- ලිඛිත විභාග
- ප්‍රශ්නාවලි
- නිර්වචන
- ස්මරණය හා ආවර්ජනය
- දන්නා දැනුම නැවත ප්‍රතිනිෂ්පාදනය

### ඉගෙනුම් ඵල පදනම් කරගත් තක්සේරුකරණය

- කාර්යසාධන (Performance) කාර්ය
- ප්‍රායෝගික ක්‍රියාකාරකම්
- ව්‍යාපෘති
- ඉදිරිපත් කිරීම්
- කාර්ය සංග්‍රහ (Portfolios)
- නිරීක්ෂණය
- රුබ්‍රික්ස් - (Rubrics)

මූලික ප්‍රශ්නය: "සාධනය පෙන්නුම් කරන සාක්ෂි මොනවා ද?"
Key question: "What evidence will show achievement?"

# තක්සේරුකරණයේ අරමුණු

teachmore.lk

ඉගෙනීමට සහාය වීම, ශිෂ්‍ය ස්වයං ඉගෙනුම් අවස්ථා වැඩි කිරීම සහ වාර්තාකරණය සඳහා තක්සේරුකරණය තුලිතව භාවිත කිරීම

## ඉගෙනීම සඳහා තක්සේරුකරණය

**ASSESSMENT FOR LEARNING**

- ගුරුවරයා සාක්ෂි රැස් කිරීම
- ප්‍රතිපෝෂණ පියවර අනුව වැඩිදියුණු කිරීම
- සම්භවන සහ අඛණ්ඩ තක්සේරුකරණය

## ඉගෙනීම ලෙස තක්සේරුකරණය

**ASSESSMENT AS LEARNING**

- සිසුන් ඉගෙනීම නිරීක්ෂණය කිරීම
- ස්වයං තක්සේරුව හා ප්‍රත්‍යවේක්ෂණය
- ශිෂ්‍ය ස්වාධීනත්වය

## උගත් දේ තක්සේරුකරණය

**ASSESSMENT OF LEARNING**

- ඉගෙනුම් සාධනය වාර්තාකරණයට සහාය දීම
- සාධනය, නිර්ණායකයන්ට අනුව විනිශ්චය කිරීම (සමත්/ අසමත් බව)

teachmore.lk

# තක්සේරුකරණය සඳහා යොදා ගත හැකි උපකරණ/මෙවලම්

ඉගෙනුම් පල මැනීම සඳහා එක් ක්‍රමයකට වඩා භාවිත කිරීම වඩාත් සුදුසු ය.

| | | | |
|---|---|---|---|
| නිරීක්ෂණය<br>Observation | පැවරුම්<br>Assignments | කාර්යසාධනය<br>Performance | ව්‍යාපෘති<br>Projects |
| ප්‍රායෝගික වැඩ<br>Practical work | කාර්ය සංග්‍රහ<br>Portfolios | ඉදිරිපත් කිරීම්<br>Presentations | රුබ්‍රික්ස්<br>Rubrics |

විද්‍යාව

මෙම තක්සේරුකරණ මෙවලම් අපේක්ෂිත ඉගෙනුම් පල සමග ගැළපිය යුතුය.
මීට අමතරව නිරීක්ෂණ පත්‍රිකා (Obeservation sheets), පිරික්සුම් ලැයිස්තු (Check Lists), යනාදිය ද භාවිත කළ හැකි ය.

teachmore.lk

# පෙළපොතෙන් මොඩියුලයට

මොඩියුලයක් යනු ප්‍රමාණයෙන් කුඩා පෙළපොතක තවත් එක් පරිච්ඡේදයක් පමණක් නොවේ

**පෙළපොත - ආකෘතිය**

- පරිච්ඡේදය
- ඉගැන්වීම
- අභ්‍යාස
- සම්පූර්ණ කිරීම
- වේගය (ඉගැන්වීමේ ප්‍රගතිය) සඳහා දින දර්ශනය / පරිච්ඡේද අනුපිළිවෙළ අනුගමනය කිරීම

**මොඩියුල - ආකෘතිය**

- ඉගෙනුම් පලය
- ක්‍රියාකාරකම් + සම්පත්
- පුහුණුව / භාවිතය
- ඉගෙනුම් සාධන සාක්ෂි රැස් කිරීම
- ප්‍රතිපෝෂණය

දැනුම
සංකල්ප • මූලධර්ම

භාවිතය
ක්‍රියාකාරකම් • පුහුණුව

නිපුණතාව
කාර්යසාධනය • සාක්ෂි

ඇයි
විෂයයන් + මොඩියුල?

# පෙළපොත් පාදක ආකෘතිය හා මොඩියුල පාදක ආකෘතිය

සංවිධාන ඒකකය වෙනස් වන විට, ගුරු සැලසුම්කරණය ද වෙනස් වේ.

**The unit of organization changes — and so does teacher planning**

| මානය | පෙළපොත් පාදක | මොඩියුල පාදක |
|---|---|---|
| ප්‍රාථමික ද්‍රව්‍ය | තනි, වසරකට ම -දිගු පෙළපොත | ඉගෙනුම් පල මෙහෙයවන ඉගෙනුම් ඒකකය + ගුණාත්මක යෙදවුම් (සම්පත්) |
| වේගය (ඉගැන්වීම් ප්‍රගතිය) | කාලය/ පරිච්ඡේදය සම්පූර්ණ කිරීම | නිශ්චිත ඉගෙනුම් පල අත්පත් කර ගැනීම |
| පන්ති කාමරය | කියවීම හා සටහන්-පිටපත් කිරීම | ක්‍රියාකාරකම්, අනාවරණය, ප්‍රායෝගික පුහුණුව සහ ගැටලු විසඳීම |

# පෙළපොත් පාදක ආකෘතිය හා මොඩියුල පාදක ආකෘතිය

**සංවිධාන ඒකකය වෙනස් වන විට, ගුරු සැලසුම්කරණය ද වෙනස් වේ.**

**The unit of organization changes — and so does teacher planning**

| මානය | පෙළපොත් පාදක | මොඩියුල පාදක |
|---|---|---|
| සමෝධානය | බොහෝ විට විෂයයන් වෙන් වෙන් ව ඉගැන්වීම | සිරස් හා තිරස් සම්බන්ධීකරණය |
| ශිෂ්‍යයාගේ ස්වාධීනත්වය | ප්‍රධාන වශයෙන් පෙළපොත සහ අභ්‍යාස | ස්වයං ඉගෙනීම සඳහා සම්පත් භාවිතය සහ මගපෙන්වීම සහිත ප්‍රායෝගික පුහුණුව |
| ගුරුවරයා සැලසුම්කරණය | "මීළඟ පරිච්ඡේදය? " | "මීළඟ ඉගෙනුම් පලය කුමක් ද සහ එය අත්පත් කරගන්නේ කෙසේ ද? අත්පත් කර ගත්තා ද? |

# ඉගෙනුම් පල මූලික කරගත් මොඩියුලයක ව්‍යුහය

**විෂයමාලා සම්පාදකයන් හා ගුරු අධ්‍යාපනඥයන් සඳහා ප්‍රායෝගික සැලසුම් අනුක්‍රමය**

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| ඉගෙනුම් පල | අන්තර්ගතය හෝ සංකල්ප | ක්‍රියාකාර-කම් සහ සම්පත් භාවිතය (යෙදවුම්) | ප්‍රායෝගික භාවිතය | ඉගෙනුම් පල සාධනය පිළිබඳ සාක්ෂි | ප්‍රතිපෝෂණය/ තවදුරටත් ඉගෙනීම |

ඉගෙනුම් පල → ක්‍රියාකාරකම →තක්සේරුව → සාධනය → ප්‍රතිපෝෂණය

# ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක කිරීම
# 2027
# 2 සහ 6 ශ්‍රේණි සඳහා

# ප්‍රාථමික අධ්‍යාපනය: 1–5 ශ්‍රේණි

ප්‍රාථමික

teachmore.lk

| ප්‍රධාන අදියර | ශ්‍රේණි | මූලික ඉගෙනීම් අවධාරණය | පාසල් කාලය |
|---|---|---|---|
| පළමු ප්‍රධාන අදියර | 1–2 | මව් භාෂාව; ක්‍රියාකාරකම්-පාදක වාචික ඉංග්‍රීසි; සංඛ්‍යා සාක්ෂරතාව; විද්‍යාව/පරිසරය; ආගම/වටිනාකම්; සෞන්දර්ය; සෞඛ්‍ය/ශාරීරික අධ්‍යාපනය; විෂය සමගාමී ඉගෙනීම | 7:30–11:45 |
| දෙවන ප්‍රධාන අදියර | 3–4 | සාක්ෂරතාව, ඉංග්‍රීසි, සංඛ්‍යා සාක්ෂරතාව, විද්‍යාව/පරිසරය, වටිනාකම්, සෞන්දර්යය, සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය ශක්තිමත් කිරීම | 7:30–13:00 |
| තෙවන ප්‍රධාන අදියර | 5 | මූලික නිපුණතා තහවුරු කර ද්විතීයික අධ්‍යාපනය සඳහා ශිෂ්‍යයන් සූදානම් කිරීම | 7:30–13:30 |

teachmore.lk



# ප්‍රාථමික අධ්‍යාපනය: 1-5 ශ්‍රේණි

- ප්‍රාථමික අධ්‍යාපනයෙන් ඉගෙනුම් පල පාදක, ක්‍රියාකාරකම් පාදක සහ ගැටලු විසඳීමේ ඉගැන්වීම් ක්‍රමවේද, ප්‍රවර්ධනය කළ යුතු අතර සෑම ශ්‍රේණියකට ම ඇති ක්‍රියාකාරකම් පොත් (Activity Books) මගින් සුථත්‍ය අද්දැකීම් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබිය යුතු ය.
- ක්‍රියාකාරකම් වැඩි හා ලිවීමේ කාර්යය අඩු, ශිෂ්‍ය හිතකාමී හා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් පරිසරයක් අවධාරණය කරයි.
- ප්‍රධාන ඉගෙනුම් පල අතර සාක්ෂරතාව, සංඛ්‍යා සාක්ෂරතාව, සමාජ හා සංස්කෘතික කුසලතා, මූලික ජීවන කුසලතා, මූල්‍ය සාක්ෂරතාව සහ සමාජ-චිත්තවේගීය සංවර්ධනය ඇතුළත් වේ.

# ප්‍රාථමික අධ්‍යාපනය (ශ්‍රේණි 1-5)

ප්‍රාථමික

teachmore.lk

**සතියකට අදාළ කාලසටහන ක්‍රියාත්මක වීම සඳහා කාලය වෙන් කිරීම**

| ඉගෙනුම් ක්ෂේත්‍රය | පළමු ප්‍රධාන අදියර | දෙවන ප්‍රධාන අදියර | තුන්වන ප්‍රධාන අදියර |
|---|---|---|---|
| මව් භාෂාව (සිංහල/දෙමළ) | 05:00 | 05:00 | 05:00 |
| ක්‍රියාකාරකම්-පාදක වාචික ඉංග්‍රීසි | 00:50 | — | — |
| ඉංග්‍රීසි භාෂාව | — | 03:00 | 03:30 |
| දෙවන ජාතික භාෂාව | 00:30 | 01:00 | 01:00 |
| ගණිතය | 03:10 | 04:40 | 04:40 |
| ආගමික අධ්‍යාපනය | 01:15 | 02:00 | 02:00 |
| මූලික විද්‍යාව හා පාරිසරික අදාළ ක්‍රියාකාරකම් | 04:35 | 04:40 | 06:40 |
| සෞන්දර්ය ක්‍රියාකාරකම් | 00:50 | 01:20 | 01:20 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 00:50 | 02:00 | 02:00 |
| විවේක කාලය | 02:30 | 02:30 | 02:30 |
| වෙනත් (රැස්වීම, විෂය සමගාමී ක්‍රියාකාරකම්) | 01:45 | 01:20 | 01:20 |
| **එකතුව** | 21:15 | 27:30 | 30:00 |

teachmore.lk

# නව පාරිභාෂික වචන හා ඒවා ක්‍රියාත්මක කිරීමේ අර්ථය

| පාරිභාෂික වචනය | භාෂා අර්ථය | ක්‍රියාත්මක කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|
| විෂය | දිගු කාලයක් පුරා අධ්‍යයනය කරන පුළුල් ශාස්ත්‍රීය විෂය ක්ෂේත්‍රයක්, උදාහරණ : ගණිතය, විද්‍යාව වැනි | අඛණ්ඩ විෂය දැනුම හා ප්‍රගතිය සපයයි. |
| මොඩියුලය | නිශ්චිත මාතෘකාවක්, කුසලතාවක් හෝ නිපුණතාවක් කේන්ද්‍ර කරගත් සංක්ෂිප්ත හා ස්වයංපූර්ණ ඉගැන්වීම් ඒකකයකි. | ඉගෙනුම් පල පදනම් කරගත්, ප්‍රායෝගික ක්‍රියාකාරකම් සහිත ව සකසා ගන්නා ඉගෙනීමට සහය වෙන ඒකකයකි. |
| අත්‍යවශ්‍ය විෂය/මොඩියුලය | සියලු ශිෂ්‍යයන් අනිවාර්යයෙන් හැදෑරිය යුතු මූලික ඉගෙනීම් කරුණු ඇතුළත් ඉගෙනුම් ඒකකයකි | සියලු ශිෂ්‍යයන් පොදු මූලික පදනමක් සහ අත්‍යවශ්‍ය ඉගෙනුම් පල අත්පත් කර ගනියි. |

# නව පාරිභාෂික වචන හා ඒවා ක්‍රියාත්මක කිරීමේ අර්ථය

teachmore.lk

| පාරිභාෂික වචනය | භාෂා අර්ථය | ක්‍රියාත්මක කිරීමේ දී සැලකිල්ලට ගත යුතු කරුණු |
|---|---|---|
| වරණීය (තෝරා ගන්නා) විෂය/ මොඩියුලය | පාසලේ සුලබතාව මත, සිසු රුචිකත්ව, හැකියාවන් හා අනාගත අභිලාෂ අනුව ලබා දෙන තේරීම් ඒකකයකි. | ශිෂ්‍යයන්ගේ තේරීම් හා රුචිකත්වයට අනුව ඉගෙනුම් අවස්ථා වැඩි කරයි. |
| සම්භාරය | ඉගෙනුම් ප්‍රමාණය මනින ඒකකයකි; ද්විතීයික විෂයමාලාවේ සම්භාර ඒකකයක් ආසන්න වශයෙන් පැය 10ක් / මිනිත්තු 600ක් වේ. (අපේක්ෂිත සමස්ත ඉගෙනුම් කාලය- Notional Hours) | වැඩබර (work load), ප්‍රගතිය සහ ශක්‍ය කාලසටහන් සැලසුම් කිරීමට උපකාරී වේ. |
| ඉගෙනුම් ද්‍රව්‍ය | ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කර ඉගෙනුම් පල සාධනය සඳහා සහාය වන ද්‍රව්‍ය | මොඩියුල, ක්‍රියාකාරකම් පොත් හා ගුරු මාර්ගෝපදේශ අනවශ්‍ය සැලසුම් බර අඩු කරයි. |

teachmore.lk

# ඉගෙනීම, සම්භාර සහ තක්සේරුව - Learning, Credits and Assessment

| අංගය/ Element | දිශානතිය Key direction |
|---|---|
| සම්භාර - Credit | අපේක්ෂිත සමස්ත ඉගෙනුම් කාලය- (Notional Hours) 1 සම්භාරයක් (credit) ≈ පැය 10 hours / මිනිත්තු 600 minutes of structured learning (notional hours). |
| වාර අනුව ඉගෙනුම් ප්‍රගතිය Term progression | වාරයකට අවම වශයෙන් සම්භාර 27ක් ශිෂ්‍යයා විසින් සම්පූර්ණ කළ යුතු ය. |
| වාර්ෂික ප්‍රගතිය හා උසස් කිරීම Annual progression | සාමාන්‍යයෙන් සිසුන් වාර තුනක් සම්පූර්ණ කරයි; වාර තුන සාර්ථක ව නිම කිරීම ඊළඟ ශ්‍රේණියට උසස් වීමට සහාය වේ. |
| සම්භවන ඇගයීම Formative assessment | ඉගෙනුම් පල සමග පෙළ ගැස්වූ කාර්යයන්: ප්‍රශ්නාවලි, කාර්ය සාධන ගොනු, ව්‍යාපෘති, ඉදිරිපත් කිරීම් සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් |

# ඉගෙනීම, සම්භාර සහ තක්සේරුව - Learning, Credits and Assessment

| අංගය/ Element | දිශානතිය Key direction |
|---|---|
| සම්පිණ්ඩිත තක්සේරුව Summative assessment | එක් විෂයයකට වාර අවසාන සම්පිණ්ඩිත තක්සේරුවක්; ඉගෙනුම් පල සමග පෙළ ගස්වා ඇත. |
| ඉගෙනුම් පල අත්පත් කර ගත් බවට ඉගෙනුම් සාධන සාක්ෂි Evidence | මාතෘකා සහ කලින් තීරණය කරන ලද නිර්ණායක මගින් විචාරාත්මක චින්තනය, සන්නිවේදනය, නිර්මාණශීලිත්වය, සහයෝගීතාව සහ ජීවන කුසලතා අදාළ අවස්ථාවන්හි දී ග්‍රහණය කර ගත යුතු ය. |
| 9 වන ශ්‍රේණිය Grade 9 | මනෝමිතික සහ කුසලතා මත පදනම් වූ තක්සේරුව මග පෙන්වීම සහ මාර්ග තීරණ සඳහා සහය වේ; තෝරා ගැනීම/බැහැර කිරීම ලෙස අදහස් නොකෙරේ. |

teachmore.lk

# නම්‍යශීලී ඉගෙනුම් මාර්ග සහ ශිෂ්‍යයන්ගේ තේරීම්
# (Flexible Pathways and Learner Choice)

මොඩියුල මගින් ශිෂ්‍ය රුචිකත්ව, හැකියාවන්, දක්ෂතා හා අනාගත මාර්ග සඳහා සහාය ලබා දිය හැකි ය

**Modules can support interests, abilities, aptitudes and future pathways**

**CORE**
මූලික/හර
අත්‍යවශ්‍ය ඉගෙනීම සඳහා
Essential learning

**ELECTIVE**
වරණීය/තෝරා ගත හැකි
ශිෂ්‍ය රුචිකත්වය හා දක්ෂතාව වෙනුවෙන්
Interest & aptitude

**PRACTICAL**
ප්‍රායෝගික
නිපුණතා සහ ජීවිත කුසලතා
Competencies & life skills

**INTERDISCIPLINARY**
අන්තර්විෂය
පුළුල් දැක්මක් උදෙසා
Broader perspectives

**CAREER**
වෘත්තීය
අනාගත ඉගෙනීම / රැකියා/ වැඩ ලෝකය
Future learning / work

**තේරීම අර්ථවත් වන්නේ, එය ලබා දීමට පාසල් සතුව ප්‍රමාණවත් හැකියාවක් ඇති විට පමණි.**

**Choice is meaningful only when schools have the capacity to offer it.**

# කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය (6-9 ශ්‍රේණි)

30 සම්භාර/වාරයකට

teachmore.lk

| අත්‍යවශ්‍ය විෂයයන් | සම්භාර | වරණීය මොඩියුල / තෝරා ගත හැකි මොඩියුල | සම්භාර |
|---|---|---|---|
| මව් භාෂාව සහ සාහිත්‍ය (සිංහල/දෙමළ) | 3 | • ගණිතය<br>• විද්‍යාව<br>• තොරතුරු හා සන්නිවේදන<br>• ඉතිහාසය<br>• භාෂා අගය කිරීම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි)<br>• ව්‍යවහාරික තාක්ෂණය-<br>  • ජලජ සම්පත්<br>  • විදුලි සහ ඉලෙක්ට්‍රොනික<br>  • මැණික් සහ ස්වර්ණාභරණ<br>  • තේ<br>  • පොල්<br>• ගෝලීය අධ්‍යයන | 1 |
| ඉංග්‍රීසි භාෂාව | 3 | | |
| ගණිතය | 3 | | |
| විද්‍යාව | 3 | | |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 2 | | |
| ආගම | 2 | | |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 2 | | |
| ජීවිතය සඳහා තාක්ෂණවේදය | 2 | | |
| සමාජ අධ්‍යයනය (ඉතිහාසය, භූගෝල විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය) | 3 | | |
| දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ) | 1 | | |
| සෞන්දර්ය අධ්‍යාපනය | 2 | | |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 1 | | |
| ක්‍රීඩා, සමිති හා සමාජ / සමාජ සේවා /වෘත්තීය ජීවිතයට සූදානම් වීම සහ ජීවන කුසලතා (7 ශ්‍රේණියේ සිට) | 2 | | |
| එකතුව | 29 | | 1 |

# 6-9 ශ්‍රේණි සඳහා යෝජිත කාලසටහන සතියකට (කාල පරිච්ඡේද 40)

teachmore.lk

| විෂය | කාලච්ඡේද / සතිය |
|---|---|
| මව් භාෂාව සහ සාහිත්‍ය (සිංහල/දෙමළ) | 5 |
| ඉංග්‍රීසි | 5 |
| ගණිතය | 5 |
| විද්‍යාව | 5 |
| සමාජ අධ්‍යයනය | 4 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | 2 |
| ජීවිතය සඳහා තාක්ෂණවේදය | 2 |
| ආගම | 2 |
| දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ) | 1 |
| සෞන්දර්ය අධ්‍යාපනය | 3 |
| ව්‍යවසායකත්වය හා මූල්‍ය සාක්ෂරතාව | 1 |
| සෞඛ්‍ය සහ ශාරීරික අධ්‍යාපනය | 2 |
| වරණීය/තෝරා ගන්නා මොඩියුලය | 1 |
| පුස්තකාලය | 1 |
| ක්‍රීඩා, සමාජ, සංගම් / සමාජ සේවා/ වෘත්තීය ජීවිතයට සූදානම් වීම සහ ජීවන කුසලතා (7 ශ්‍රේණියේ සිට) | 1 |
| එකතුව | 40 |

# කනිෂ්ය ද්විතීයික තක්සේරුකරණය:

| තක්සේරුකරණ මූලධර්ම | විස්තරය |
|---|---|
| අරමුණ<br>Purpose | ඉගෙනුම් පලවලට පමණක් නොව, සමස්ත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට උපස්ථම්භනය ලබා දෙයි.<br>Rewards the learning process, not just outcomes. |
| අවධානය යොමු කරන ක්ෂේත්‍ර<br>Focus areas | ශිෂ්‍ය සහභාගීත්වය, ගවේෂණය, විශ්ලේෂණය සහ විනිශ්චය<br>Student engagement, exploration, analysis and judgement. |
| තක්සේරුකරණ කුසලතා<br>Skills assessed | විචාරාත්මක චින්තනය, සන්නිවේදනය, නිර්මාණශීලිත්වය, සහයෝගීතාව සහ ජීවන කුසලතා (රුබ්‍රික්ස් හරහා). Critical thinking, communication, creativity, collaboration and life skills (via rubrics). |
| ආවේදනීය ක්ෂේත්‍රය<br>Affective domain | සම්භවන තක්සේරුකරණයට ප්‍රමුඛත්වය ලබා දීම<br>Given prominence in formative assessment. |
| බර තැබීම<br>Weighting | සම්භවන (අඛණ්ඩ) 50% + සම්පිණ්ඩිත 50%.<br>50% Formative (continuous) + 50% Summative |

# කනිෂ්ඨ ද්විතීයික තක්සේරුකරණය:

teachmore.lk

| තක්සේරුකරණ මූලධර්ම | විස්තරය |
|---|---|
| සම්පිණ්ඩිත ආකෘතිය<br>Summative format | කඩදාසි සහ පැන්සල් පරීක්ෂණවලට පමණක් සීමා නොවේ.<br>Not limited to paper-and-pencil tests. |
| අඛණ්ඩ තක්සේරු සංඛ්‍යාව<br>Number of Continuous assessments | සම්භාර වටිනාකමට සමානයි; උදාහරණයක් ලෙස, සම්භාර 2ක විෂයයකට හරියට ම තක්සේරු 2ක් ඇත.<br>Equal to the credit value; e.g., a 2-credit subject has exactly 2 assessments. |
| වර්ග<br>Types | ප්‍රශ්නාවලිය/බහු වරණ; කාර්ය සංග්‍රහ; ව්‍යාපෘති; ඉදිරිපත් කිරීම් හෝ ප්‍රායෝගික ක්‍රියාකාරකම්; වෙනත් සුදුසු ක්‍රම.Quizzes/MCQs; portfolios; projects; presentations or practical activities; other suitable methods. |
| ශ්‍රේණිගත කිරීම<br>Grading | සෑම තක්සේරුවක් ම ලකුණු 100න් පරිමාණය කෙරේ.<br>Every assessment scaled out of 100 marks. |
| අවසාන ලකුණ<br>Final mark | විෂය අවසාන ලකුණ Subject Final Mark =<br>(50% × සම්භවන) (අඛණ්ඩ) + (50% × සම්පිණ්ඩිත). |

# ශ්‍රේණිගත කිරීම සහ පාසල් ඉගැන්වීම් කාලය

තක්සේරුව හා ඇගයීම් අවසානයේ ලබා දෙන ශ්‍රේණි හා පුළුල් සාධන විස්තර

| ලකුණු | ශ්‍රේණිය | කාර්යසාධනය විස්තරය |
|---|---|---|
| 85–100 | A | විශිෂ්ට |
| 70–84 | B | ඉහළ සාධනය |
| 55–69 | C | සතුටුදායක |
| 40–54 | S | මූලික සාධනය |
| 40ට අඩු | W | වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. |

පාසල් දිනය/ ඉගැන්වීම් පැය
Teaching Hours

- පෙ.ව. 7:30 සිට ප.ව.1:30
- කාලච්ඡේද 8 × 40 මිනිත්තු
- සතියක පාසල් කාලය පැය 30. වෙනත් පාසල් ක්‍රියාකාරකම් හේතුවෙන් ඉගැන්වීම් කාලය අඩු විය හැකිය. (Instructional time is lower after other school activities)

# පාසල් නායකත්වය: විදුහල්පති+ ගුරු උපදේශක

ක්‍රියාත්මක කිරීම යථාර්ථයක් වන්නේ නායකත්වය හා මගපෙන්වීම තුළිනි

## විදුහල්පති

- නායකත්වය
- නිරීක්ෂණය
- ගුරු සභාය
- පාසල සැලසුම්කරණය
- සම්පත් වෙන්කිරීම
- දෙමාපියන් දැනුවත් කිරීම
- ගුණාත්මකභාවය සහතික කිරීම

## අභ්‍යන්තර අධ්‍යාපන අධීක්ෂක /ගුරු උපදේශක

- ගුරුවරයාට මගපෙන්වීම
- පන්ති කාමරය නිරීක්ෂණය
- නිරීක්ෂණය
- වෘත්තීය මගපෙන්වීම
- දත්ත රැස්කිරීම
- ගැටලු විසඳීම
- වාර්තාකරණය

# අධ්‍යාපන පද්ධතියේ විවිධ මට්ටම්වල භූමිකා

**"සෑම මට්ටමකට ම වගකීම් ඇත — එම වගකීම් ඉටුකිරීම තහවුරු කිරීමට සාක්ෂි අවශ්‍ය වේ."**

**අධ්‍යාපන අමාත්‍යාංශය**

- ප්‍රතිපත්ති දිශානතිය • ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම • නියාමනය • සම්බන්ධීකරණය
- ධාරිතා සංවර්ධනය
- අධීක්ෂණය • ඇගයීම • වාර්තාකරණය • තත්ත්ව සහතික කිරීම සහ තවත් කරුණු

**ජාතික අධ්‍යාපන ආයතනය**

- විෂයමාලා • ගුරු මාර්ගෝපදේශ • පුහුණුව • පර්යේෂණ
- ඇගයීම • සංශෝධනය • වෘත්තීය සහාය • අධ්‍යාපනඥයන් සවිබල ගැන්වීම

**විභාග දෙපාර්තමේන්තුව**

- ජාතික ඇගයීම් • ඇගයීම • සහතිකකරණය
- ප්‍රමිති • වාර්තාකරණය ආදිය

**අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**

- මොඩියුල • මුද්‍රණය සහ බෙදාහැරීම
- සම්පත් සංවර්ධනය • විෂයමාලා ක්‍රියාත්මක කිරීමට සහාය දැක්වීම

# අධ්‍යාපන පද්ධතියේ විවිධ මට්ටම්වල භූමිකා

teachmore.lk

"සෑම මට්ටමකට ම වගකීම් ඇත — එම වගකීම් ඉටුකිරීම තහවුරු කිරීමට සාක්ෂි අවශ්‍ය වේ."

**පළාත**

- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම • සම්බන්ධීකරණය • ධාරිතා සංවර්ධනය
- ඇගයීම • වාර්තාකරණය ආදිය

**කලාපය**

- සම්බන්ධීකරණය • සම්පත් කළමනාකරණය • පුහුණුව • අධීක්ෂණය
- වාර්තාකරණය • පාසල් සහාය ආදිය

**කොට්ඨාසය**

- ක්‍රියාත්මක කිරීම • පාසල් සැලසුම්කරණය • සම්පත් • තත්ත්ව සහතික කිරීම
- ගුරු සහාය • අධීක්ෂණය ආදිය

**පාසල**

- ක්‍රියාත්මක කිරීම • පාසල් සැලසුම්කරණය • සම්පත් • තත්ත්ව සහතික කිරීම
- දෙමාපිය/ප්‍රජා සම්බන්ධතා ආදිය

**ගුරුවරයා**

- ඉගැන්වීම • මඟපෙන්වීම • ඉගෙනීමට පහසුකම් සැලසීම • ඇගයීම • සාක්ෂි
- ප්‍රතිපෝෂණය • වෘත්තීය සංවර්ධනය ආදිය

teachmore.lk

# පාසල් මට්ටමේ ක්‍රියාත්මක කිරීම සඳහා කෙටි මාර්ගෝපදේශයක්

| ඔබ ......... නම් | ඔබගෙන්ම විමසන්න |
|---|---|
| ගුරුවරයෙකු | අපේක්ෂිත ඉගෙනුම් පලය කුමක් ද? සිසුන් කුමක් කරනු ඇත් ද? මා විසින් අත්පත් කර ගත් සාක්ෂි එකතු කරන්නේ කෙසේ ද? මා විසින් ලබා දෙන ප්‍රතිපෝෂණය කුමක් ද? |
| ගුරු උපදේශකයෙකු | ගුරු හා ශිෂ්‍ය ප්‍රගතිය පෙන්නුම් කරන ඉගෙනුම් සාධන (සාක්ෂි) මොනවා ද? ගුරුවරයාට අවශ්‍ය සහාය කුමක් ද? ඔහු/ඇය සමග බෙදාගත හැකි යහපත් භාවිත මොනවා ද? |
| විදුහල්පතිවරයෙකු | ශිෂ්‍ය/ඉගෙනුම් කේන්ද්‍රීය ඉගෙනීමට පාසල් සංස්කෘතිය සහාය දක්වන්නේ ද? කාලසටහන, සම්පත් සහ ගුරු යෙදවීම අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කර ගැනීමට පහසුකම් සලසන්නේ ද? |
| පරිපාලකයෙකු | පාසල්වලට අවශ්‍ය කාලය, මානව සම්පත්, අනෙකුත් සම්පත්, පුහුණුව සහ ගැටලු විසඳීම සඳහා සහාය ලැබෙන්නේ ද? අසමානතා විසඳීමට කටයුතු කරන්නේ ද? |
| දෙමාපියෙකු | මම මගේ දරුවාගේ ලකුණු පමණක් නොව කුසලතා, කුතුහලය, චරිතය සහ යහපැවැත්ම ද අගය කරන්නේ ද? |
| ශිෂ්‍යයකු | මට දැන් පැහැදිලි කිරීමට, නිර්මාණය කිරීමට, විසඳීමට, ආදර්ශනය කිරීමට හෝ වැඩිදියුණු කිරීමට කළ හැක්කේ කුමක් ද? |

**ඉගෙනුම් පල • ඉගෙනීම • සාධනය**

teachmore.lk

7 සිට 13 වන ශ්‍රේණිය සඳහා වන අවසාන විෂය/මොඩියුල ව්‍යාප්තිය, ඇගයීම් රාමුව හා ප්‍රමිතීන් සහ අනෙකුත් අදාළ විස්තර හා රෙගුලාසි අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දැනුම් දෙනු ලැබේ.

teachmore.lk

එන්න එක් ව අපි අධ්‍යාපනය පරිවර්තනය කරමු

# ස්තුතියි